**ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තක්සේරු දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 18 දින ප්‍රධාන තක්සේරුකරු වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 17 දින ප්‍රධාන තක්සේරුකරු වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට තක්සේරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය තුළ වෙනත් ලැබීම් රු.26,904,366 ක් වුවද එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි රු 5,553, 159 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වෙනත් ලැබීම් රු. 21,351,207 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ ආකෘති පිළිබඳ විස්තර අධ්‍යනය කරමින් පවතින අතර 2021.12.31 දිනට ගිණුම් පිළියෙල කිරීමේ දී අඩුපාඩු අවම කර ගැනීමට සටහන් කර ගෙන ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 06 ට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව තැන්පතු ලැබීම රු. 146, 004,345 ක් වුවද එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි රු. 145,657,846 ක් ලෙස දක්වා තිබුණි. භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව තැන්පතු ගෙවීම් රු. 108,019, 418 ක් වුවද එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි රු. 107, 672, 919 ක් ලෙස දක්වා තිබුණි. | තැන්පතු ගිණුම් අංක 6000-0-0-13-0-158-0 ට බැර විය යුතු රු. 346,499 මුදල තැන්පත් ගිණුම් අංක 6000-0-0-020-0-005-0 ට බැර කර ඇති අතර එය මාරුපත්‍ර අංක TR/2019/AC/156 මඟින් නිරවුල් කර ඇත. | -එම- |
| (ඇ) | අනෙකුත් දෙපාර්තමේන්තු වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම රු. 24.234.408 ක් වුවද එය රු. 11, 177,682 ක් ලෙස අග්‍රිම ගැලපුම් ගිණුමෙහි දක්වා තිබුණි. | දෙපාර්තමේන්තු සිගාස් සටහන් අනුව වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් හර රු.19,247,837.82 හා බැර රු.8,070,156.26 වේ. එම නිසා දෙපාර්තමේන්තු වෙනුවෙන් දරණ ලද වියදම රු.11,177,681.56 වේ. | -එම- |
| (ඈ) | නිරවුල් කල යුතු අග්‍රිම ගැලපුම් ගිණුමෙහි සාවද්‍ය ලෙස බැර කරන ලද රු. 46,981,387 ක ආරම්භක ශේෂයක් දක්වා තිබුණි. | අදාල ගිණුම පිළිබඳ අධ්‍යනය කරමින් පවතී. 2021 දෙසැම්බර් 31 දිනට ගිණුම් පිළියෙළ කිරීමේ දී අඩුපාඩු අවම කරගැනීමට සටහන් කරගෙන ඇත. | -එම- |

**1.6.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පොත් අනුව ස්ථාවර වත්කම්හි වටිනාකම රු. 392,358,853 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ලද ස්ථාවර වත්කම්හි වටිනාකම රු. 396,409,239 ක් ලෙස දැක්වීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ස්ථාවර වත්කම් රු. 4,050,376 ක් වැඩිපුර දක්වා තිබුණි. | 2020 දෙසැම්බර් මස තක්සේරු දෙපාර්තමේන්තුවට අදාල ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමෙන් පසු web upload කර වර්ෂ අවසාන ගිණුම් සාරාංශය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළද වාර්තා යාවත්කාලීන වී නොමැති අතර 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය එලෙසම භාණ්ඩාගාර මුද්‍රිත වල සටහන් වී ඇත. එම ශේෂ නිවැරදි කිරීමට කටයුතු සිදු කර ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 06 ට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | රු. 46, 981,387 ක් වූ නොපියවූ අග්‍රිම ගිණුමේ ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කමක් ලෙස හා ජංගම වගකීමක් ලෙස දැක්විය යුතු නමුත් එලෙස දක්වා නොතිබුණි. | වන්දි විනිශ්චය සභාවේ ලැබීම් ලෙස රු. 46,981,387.00 වූ මුදල 2021 මාර්තු 08 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට බැර කරන ලදී. | -එම- |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවට රු. 68,164,750 ක ආදායමක් ලැබී තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි එය රු.56,802,482 ක් ලෙස දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තුවට ලද රු.68,164,750.00 ක ආදායම සටහන් වී ඇත්තේ හරස් සටහන් ද සමඟිනි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 06 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය දළ පදනමින් සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තු පොත් අනුව ආදායම් නොවන ලැබීම් රු.26,904,366 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.3,137,004 ක් හා 6,015,093 ක් ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් රු.9,152,092 ක් ලෙස සම්පිණ්ඩන වාර්තාවේ සටහන් වුවද එය රු.3,137,004 ක් විය යුතුය. | -එම- |
| (ඇ) | දෙපාර්තමේන්තු පොත් අනුව පුනරාවර්තන වියදම්හි එකතුව රු.429,163,822 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි පුනරාවර්තන වියදම් ලෙස රු.427,627,465 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.1,536,357 ක ශුද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වෙනසක් නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තු පොත් සටහන් වී ඇත්තේ හරස් සටහන් ද සමගිනි. | -එම- |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් දෙපාර්තමේන්තු වෙනුවෙන් රු. 24,234,408 ක වියදමක් දරා තිබුණ ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි එම වටිනාකම රු.4,629,825 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 19,004,583 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (ඉ) | දෙපාර්තමේන්තු පොත් අනුව භාණ්ඩාගාරයට පියවා ඇති මුදල රු.664 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි භාණ්ඩාගාරයට පියවන ලද මුදල රු.1,761,792 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයේ රු.1,761,128 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (ඊ) | දෙපාර්තමේන්තු පොත් අනුව ප්‍රාග්ධන වියදම රු. 214,433,370 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.211,816,514 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.2,616,856 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (උ) | දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ලැබීම් රු. 27,407,625 ක් හා අත්තිකාරම් ගෙවීම් රු. 24,128,018 ක් වුවද එම වටිනාකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ගැලපීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඍ) | දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය තුළ තැන්පතු ලැබීම් රු. 146,004,345 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු. 7,700,352 ක් ලෙස දක්වා තිබුණු අතර තැන්පතු ගෙවීම් රු. 108,019,418 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු. 6,299,335 ක් ලෙස දක්වා තිබුණි. | රු.1,761,128 මුදල මැතිවරණ කොමිසම මඟින් ලැබුණු මැතිවරණ අත්තිකාරකමක් වන අතර තක්සේරු දෙපාර්තමේන්තුවට එම මුදල ලැබී ඇත්තේ 2020 ජූලි මස වන අතර එම මුදල ජූලි මාසයක් තුල පියවීමට කටයුතු කර ඇත. | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 ආදායම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට හිඟ තක්සේරු ආදායමින් රු. 457,328,864 ක් හෙවත් සියයට 98 ක් වර්ෂ 01 සිට වසර 12 ක් දක්වා වූ කාල පරාසයක් තල හිඟව පවතින බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | වර්ෂ ගණනාවක සිට හිඟව පවතින ආදායම් අයකර ගැනීම සඳහා අප්‍රමාදව කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල දී පසුගිය වර්ෂය අවසානයට පැවති රු.512,531,243 ක හිඟ ආදායමෙන් රු.5,110,251 ක් හෙවත් සියයට 02 ක් පමණක් අයකර ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ දී හිඟ ශේෂයන්ට අදාළව අත්හැර දැමීම්වල මුළු එකතුව රු.50,092,129 ක් වූ බව නිරීක්ෂණය විය. | -එම- | හිඟ ආදායම් අත්හැර දැමීමට පූර්වයෙන් අයකර ගැනීම සඳහා උපරිම ප්‍රයත්නයන් දැරිය යුතු වීම. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් වාර්ථාව අනුව දිගුකාලීනව විශාල ආදායමක් හිඟව පවතින ආයතන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් | -එම- | මෙම ආයතන සමග සාකච්ඡා කර හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවය |

| | | | |
|---|---|---|---|
| | ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන ආයතන වලින් එකතුව රු.185,877,099 ක් අය කර ගත යුතුව පැවති බව නිරීක්ෂණය විය. එම හිඟ කාල පරාසය වර්ෂ 2008 සිට 2017 දක්වා විය. | | |
| (ඉ) | මහ කොළඹ පළාත් තක්සේරු කාර්යාලයේ සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව පවතින ආදායම රු.268,108,023 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය අවසානයට පවතින මුළු හිඟ ආදායමෙන් සියයට 58 ක් බව නිරීක්ෂණය විය. | -එම- | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවය |

## 2.2 වියදම් කළමනාකරණය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයයන් 08 ක හා මූලධන වැය විෂයන් 04 ක් සඳහා රු. මිලියන 33.4 හා 20.44 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කළ පසු පිළිවෙලින් රු. මිලියන 10.96 හා 4.7 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 100 ක පරාසයක විය. | කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හේතුවෙන් 2020 මාර්තු මස සිට ඇඳිරි නීතිය පනවා රට වසා තැබීම හේතුවෙන් සැලසුම් කර පරිදි වියදම් කිරීම කළ නොහැකි විය. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව හා තාත්වික ලෙස පිළියෙළ කිරීම. |
| (ආ) | අංක 251-01-01-1102 හා අංක 251-01-01-2106 දරන වැය විෂයන් එනම් විදේශිය ගමන් වියදම් හා මෘදුකාංග සංවර්ධනය සඳහා වෙන්කළ ප්‍රතිපාදන රු. 1500,000 හා රු.500,000 ක් සම්පූර්ණයෙන්ම (100%) ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හේතුවෙන් 2020 මාර්තු මස සිට ඇඳිරි නීතිය පනවා රට වසා තැබීම හේතුවෙන් සැලසුම් කර තිබු පරිදි වියදම් කිරීම කළ නොහැකි විය. | -එම- |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ අයවිය යුතු ශේෂය රු. 91,234,063.83 ක් වුවද, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ අනුව අයවිය යුතු ශේෂය රු.91,165,205.83 ක් විය. ඒ අනුව රු. 71,024 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 01 අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | විශ්‍රාම ගොස් මාස තුනක හා වසර තුනක කාලයක සිට නිලධාරීන් 10 කුගෙන් අයවිය යුතු එකතුව රු.1,516,797 ක ණය ශේෂ අයකරගැනීමට අපොහොසත් වී තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 05 සිට වර්ෂ 08 දක්වා කාල පරාසයකට අයත් එකතුව රු.308,614 ක හිඟ ණය ශේෂයන් 03 ක් අයකරගැනීමකින් තොරව පැවතුණි. | -එම- | -එම- |
| (ඈ) | සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 5 ට වැඩි කාලයකට අයත් එකතුව රු.85,810 ක හිඟ ණය ශේෂයන් 05 ක් අයකරගැනීමකින් තොරව පැවතුණි. | -එම- | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටුනොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යයන් ඉටුනොකළ පොදු ලිපි ගොනු 9,528 ක් ද වරිපනම් සම්බන්ධ ලිපි ගොනු 3,182 ක් ද ඉතිරි වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු කිරීමේ අවශ්‍යතාවය. |

4. **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 49 ක් එනම් පුරප්පාඩු 540 ක් පැවතීම. | අදහස් දක්වා නොතිබුණි. | මෙම තනතුරු පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපායි නම් එම පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |